# 71 කැරලිකරුවන්ටත් කතානායක පත්වීම් දීලා - උදය ගම්මන්පිල

කථානායකතුමාගේ අනග රැගුම් සහ දූෂණ පිළිබඳ මාධ්‍යවලින් වාතර්ා කළාම, තමන්ගේ රහස්‍ය තොරතුරු මාධ්‍යවලට හෙළිදරව් වුණේ කොහොමද කියලා බලන්න විමශර්නයක් සිදු කරන්නැයි පාලර්ීමේන්තුවේ කථානායකතුමා මහලේකම්තුමියට නියෝගයක් ලබා දුන්නා. ඒ නියෝගයට පින්සිදු වෙන්න, කථානායකතුමාට එරෙහිව මාධ්‍ය කරපු චෝදනාවලට සාක්ෂි අද අපි අතට ලැබිලා තිබෙනවා.

මේ විමශර්න වාතර්ාව නම් කරලා තිබෙන්නේ "කථානායකවරයා පිළිබඳ රහස්‍ය තොරතුරු මාධ්‍යයට හෙළිදරව් වීම පිළිබඳ විමශර්නයේ වාතර්ාව" ලෙසයි. මොකක්ද මේ හෙළිදරව් වෙලා තියෙන්නේ? කථානායක පිළිබඳ රහස්‍ය තොරතුරු මිස අසත්‍ය තොරතුරු එහෙම නෙවෙයි. ඒ නිසා කථානායකතුමා මේ විමශර්නය සිදු කිරීම හරහාම පිළිඅරගෙන තියෙනවා තමන් ගැන මාධ්‍ය වාතර්ා කළේ බොරුවක් නෙවෙයි, ඇත්තක් කියන එකයි. "මම රහසේ සඟවාගෙන ඉන්න තොරතුරු කවුද යකෝ මාධ්‍යවලට දුන්නේ කියලා හොයා බලපල්ලා" කියලා තමයි මහලේකම්තුමියට කථානායකතුමා නියෝග කරලා තිබෙන්නේ.

ඇත්තෙන්ම එතුමා විසින්ම සකස් කරපු මේ වාතර්ාවෙන් සිද්ධ වෙලා තියෙන්නේ, එතුමාට එරෙහිව මාධ්‍ය හරහා නැගූ චෝදනා සත්‍ය බවට සාක්ෂි සහිතව තහවුරු වීම පමණමයි.

දැන් ඉතින් කථානායකතුමනි, අපි මේ ගැන මුලින් කතා කළාම මාධ්‍ය හරහා ඔබතුමා කවුද මේ රහස්‍ය තොරතුරු මාධ්‍යවලට හෙළිදරව් කළේ කියලා හොයන්න විමශර්නයක් කරන්න තීරණය කළා. එහි ප්‍රතිඵලය වුණේ ඔබතුමාට එරෙහිව නැගූ සෑම චෝදනාවක්ම සත්‍යයක් බවට සාක්ෂි සහිතව තහවුරු වීම පමණයි. දැන් ඉතින් මේ වාතර්ාව මට ලැබුණේ කොහොමද කියලා හොයන්න තවත් විමශර්නයක් පටන් ගන්න එපා. ඒ විමශර්නය පටන් ගත්තොත්, මාලිමාවයි ජවිපෙයි අතර තිබෙන විරසකය නයි පොළොං ගැටුමක් බවට පරිවතර්නය වීමේ අවදානමක් තිබෙනවා.

2025 අගෝස්තු මාසේ මේ වාතර්ාව සකස් කළාම, මේ වාතර්ාවේ පිටපතක් තොරතුරු දැනගැනීමේ අයිතිය පනත යටතේ මට ලබා දෙන්න කියලා පාලර්ීමේන්තුවේ තොරතුරු නිලධාරියාගෙන් මම ඉල්ලීමක් කළා. එතකොට තොරතුරු නිලධාරියා දැනුම් දුන්නේ, "කථානායකතුමාගේ උපදෙස් මත එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි" කියලයි. එහෙම කථානායකට තොරතුරු නිලධාරියා දෙන තොරතුරු දෙන්න එපා කියන්න කිසිම බලයක් නැති නිසා, ඒ තීරණයට එරෙහිව මම නම් කළ නිලධාරියාට අභියාචනයක් කළා. මෙන්න බොලේ නම් කළ නිලධාරියත් එවනවා "කථානායකතුමාගේ උපදෙස් පරිදි වාතර්ාව ලබා දීම ප්‍රතික්ෂේප කරමි" කියලා. මම ඒ පාර ඒ තීරණයට එරෙහිව තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කළා.

ඒ අභියාචනා විමශර්නය ඇදී ඇදී යද්දී, මා ගැන අනුකම්පා කළ මීයෙක් කථානායකතුමාගේ ලාච්චුව ඇතුළට රිංගලා මේක අරගෙන. කථානායකතුමා මේක වෙන කාටවත් දෙන්නේ නැතුව කථානායකතුමාගේ ලාච්චුවක දාලා අගුලු දාලා යතුර එතුමා ගාව තියන් ඉන්නේ, හදිස්සියටවත් පීයන් කෙනෙකුටවත් දෙන්නේ නෑ එහෙව් වාතර්ාවේ පිටපත මට සුපුරුදු පරිදි තැපෑලෙන් ඇවිල්ලා තියෙනවා.

මට තැපෑලෙන් රහස් වාතර්ා පැමිණීම අද ප්‍රවෘත්තියක් නෙවෙයි. ඔබට මතක ඇති ඒ.එන්.ජේ. අල්විස් පාස්කු වාතර්ාව, ඉමාම් පාස්කු වාතර්ාව, ඉන්දියාව සමග අත්සන් කළ ගිවිසුම් තුනක්, බහලුම් 323 විස්තර යනාදී සියල්ල මට ඔය ආකාරයෙන්ම නිනර්ාමිකව තැපෑලෙන් ආවා. අදටත් මම දන්නේ නෑ මට මේ තොරතුරු එවන මේ මීයා කවුද කියලා. හැබැයි ජනාධිපති ලේකම් කායර්ාලයේ හිටිය මීයා, පාලර්ීමේන්තුවේ ඉන්න තම හිතවත් මීයෙකුත් යාළු කරගෙන මට උදව් කළ යුතුයි කියන ස්ථාවරයට පැමිණ ඇති බව නම් පැහැදිලියි.

මෙම විමශර්න වාතර්ාවෙන් කථානායකවරයාට එරෙහිව දූෂණ චෝදනා දහයක් (10) සාක්ෂි සහිතව ඔප්පු වී තිබෙනවා.

පළමු චෝදනාව: කථානායක නිල නිවස මහජන මුදලින් නඩත්තු කරමින් තිබියදී, ලෝරිස් පාරේ තවත් රජයේ නිල නිවසක් කථානායකවරයාගේ පාවිච්චියට යොදා ගනිමින් මහජන මුදල් අවභාවිතා කිරීම. කථානායකවරයාට තමන් කැමති නිල නිවසකට නතර වෙන්න බැහැ. මේ රටේ නිල තුනකට විතරක් නිල නිවාස කුමක්ද කියා ආයතන සංග්‍රහයේ උපලේඛනගත කරලා තියෙනවා. ඒ තමයි ජනාධිපති නිල නිවස, අගමැති නිල නිවස සහ කථානායක නිල නිවස. ඒ වෙන් කරලා තියෙන නිල නිවස හැර වෙනත් නිල නිවසක් පාවිච්චි කරන්න කථානායකවරයාට බැහැ. මේ වාතර්ාවේ සියලුම ලිපි ලේඛන තියෙනවා. නිවසේ අංකය සදාචාරාත්මක සහ ආරක්ෂ හේතු මත මම හෙළි කරන්නේ නෑ. නැතිනම් අපේ තරුණ දූවලා පුතාලා ඔය ගෙදරින් එළියට පලයව් කියලා උද්ඝෝෂනය කරන්න පුලුවන්. මහජන මුදලින් තමන්ට එක් නිවසක් වෙන් කළ නඩත්තු කරමින් තිබියදී, තවත් රජයේ නිල නිවසක් ලබා ගැනීම ඍජුවම පොදු දේපළ අවභාවිතාවක්.

දෙවන චෝදනාව: තමන් කථානායක නිල නිවසේ පදිංචිව නොසිටියදී, තමන්ට පත් කර ගැනීමට හැකි අට දෙනෙකුගෙන් යුත් කායර් මණ්ඩලයක් පත් කර මාසිකව රුපියල් 760,000ක වැටුප් මහජන මුදලින් ගෙවීම. සෑම කථානායකවරයෙකුටම තමන් පදිංචි ගේ ඇතුළේ ඉන්න සේවකයන් විදිහට රජයේ සේවකයන් ගන්න එක කටයුතුවලට බාධාවක් නිසා තමන් කැමති අට දෙනෙක් ගෙදර කටයුතුවලට බඳවා ගන්න පුළුවන්. ගෙදර පදිංචි නැහැ, හැබැයි අට දෙනා බඳවලා තියාගෙන ඉන්නවා. මේ අයට මාසිකව රුපියල් 760,000ක අවම වැටුපක් ලැබෙනවා. ඒ අයගෙන් කිසිම සේවයක් ලබා ගන්නේ නැතුව මාලිමාවේ හැච්චෝ බැච්චන්ට කීයක් හරි අතට දෙන්න ඕන නිසා තමයි මේ පිරිස පත් කරලා මාසිකව රුපියල් 760,000 ගානේ මේ වෙනකොට මිලියන ගණනක් ඔවුන්ට ගෙවා තිබෙන්නේ.

තුන්වන චෝදනාව: විශ්‍රාමික වයස ඉක්මවා ගිය, රාජකාරි ඉටු කිරීමේ හැකියාව නොමැති සේවකයන් දෙදෙනෙක් තමන්ගේ පෞද්ගලික කායර් මණ්ඩලයට පත් කර ගැනීම. කාමර සහායක නැත්නම් Room Boy කියන තනතුරට පත් කරගෙන තියෙන්නේ අවුරුදු 73ක පුද්ගලයෙක්. එතුමාට Room Boy නෙවෙයි කියන්න ඕනේ Room Grandpa කියලා. ඒ වගේම එළියේ උද්‍යානය බර වැඩ කරන්න තියෙන උද්‍යාන අධීක්ෂක තනතුරට පත් කරන් තියෙන්නේ අවුරුදු 68ක පුද්ගලයෙක්. මේ කීයක් හරි අතට දෙන්න කරපු පත්වීම් මිස වැඩ කරවා ගැනීමට කරපු පත්වීම් නෙවෙයි. බොහෝවිට 1971 රාජ්‍ය විරෝදී ජවිපෙ කැරැල්ලට සහභාගී වීමට කළගුණ සලකන්න මේ සීයල දෙන්නට පත්වීම් ලබා දුන්නා වෙන්න පුළුවන්.

හතරවන චෝදනාව: කැබිනට් මණ්ඩලයේ අවසරයකින් තොරව කථානායක නිල නිවස පයෙර්ෂණ මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට තීරණය කිරීම. මේක තීරණයක් පමණයි, කරලා නෑ. කථානායකතුමා නිල නිවස තිබියදී තවත් නිල නිවසක් අරගෙන තිබෙනවාය කියන එක මාධ්‍යවලින් හෙළිදරව් වුණාට පස්සේ, පාලර්මේන්තුවේ කායර් මණ්ඩල උපදේශක සභාව කැඳවලා, එතනදී තීරණයක් ගන්නවා කථානායක නිල නිවස පයෙර්ෂණ මධ්‍යස්ථානයක් කරන්න. හැබැයි කථානායක නිල නිවස විදිහට මේ නිවස වෙන් කරලා තියෙන්නේ ආයතන සංග්‍රහයේ උපලේඛනගත නිවසක් විදිහට. එහෙම නම් මේ නිවස වෙනත් වැඩකට භාවිතා කරනවා නම් ආයතන සංග්‍රහය සංශෝධනය කරන්න ඕනේ. ඒවැනි සංශෝධනයක් කිරීමට හැක්කේ අමාත්‍ය මණ්ඩල තීන්දුවකින් පමණයි. එවැනි තීන්දුවක් අරගන්නේ නැතුව මේ පයෙර්ෂණ මධ්‍යස්ථානයක් කිරීමට ගත් තීරණයම නීති විරෝධී තීරණයක්.

පස්වන චෝදනාව: තමන්ගේ පෞද්ගලික ලේකම්වරයාට තමන්ගේ නිල නිවස ආසන්නයෙන්ම ලෝරිස් මාවතේ රජයේ නිල නිවසක් වෙන් කර ගැනීම. ඇත්තෙන්ම පෞද්ගලික ලේකම්වරුන්ට, කථානායකවරයාගේ වේවා, ඇමතිවරයෙක්ගේ වේවා නිල නිවාසකට හිමිකම් ලබන්නේ නෑ. රජයේ අමාත්‍යාංශ ලේකම්වරුන්ට, අතිරේක ලේකම්වරුන්ට කොළඹ රාජකාරි කිරීමේදී නැවතීමට තිබෙන නිල නිවසක්, රජයේ නීති රීති සියල්ල බල්ලට දාලා කථානායකවරයා තම සමීපතයාවන පෞද්ගලික

ලේකම්වරයාට වෙන් කර ගන්නවා. අපි නිල නිවාස එකක්වත් වෙන් කරගන්නේ නෑ කියලා බලයට ආපු කථානායකතුමන්ලා තමන්ට නිල නිවාස දෙකයි, පෞද්ගලික ලේකම්ට නිල නිවාසයයි වශයෙන් නිල නිවාස දැන් ඔන්න තුනක්ම වෙන් කරගෙන හමාරයි.

හයවන චෝදනාව: කථානායක නිල නිවසේ උපලේඛනගත භාණ්ඩ නිවසින් බැහැරව භාවිතා කිරීමට කටයුතු කිරීම. කථානායක නිල නිවස සම්පූර්ණයෙන්ම නඩත්තු වෙන්නේ මහජන මුදලින්. එතන පාවිච්චි කරන ඇඳ ඇතිරිලි, කොට්ට උර, තුවා යනාදිය හෝදන වියදම, ලොන්ඩරි ගාස්තුව දරන්නේ මහජන මුදලින්. හැබැයි දැන් කථානායකතුමා ඉන්නේ නිල නිවසේ නෙවෙයිනේ. එතුමා මොකද කරන්නේ, අතන තියෙන කොට්ට මෙට්ට ඇඳ ඇතිරිලි තුවා යනාදිය තමන් ඉන්න ගෙදරට ගිහිල්ලා භාවිතා කරලා, කිලිටි වුණාම ගෙනල්ලා දානවා නිල නිවසට. දාලා එතන තියෙන අලුත් බඩු සෙට් එකක් අරගෙන යනවා. එතකොට අරවා මහජන මුදලින් ලොන්ඩරියට දාලා හෝදා ගැනීමට ලැබෙනවා. තුට්ටු දෙකේ වැඩ කරලා තියෙන්නේ! හිඟන්නොවත් මෙහෙම මහජන මුදල් අපහරණය කරන්නේ නෑ.

හත්වන චෝදනාව: පාලර්මේන්තුවේ සම්මත ක්‍රියාපටිපාටියෙන් බැහැරව තමන්ගේ නිල නිවසේ වායු සමීකරණය කැඩුණම ඒක අලුත්වැඩියා කරගන්න පාලර්මේන්තුවේ නිලධාරීන් යොදා ගැනීම. මේ පිළිබඳ වාතර්ාවේ හතරවන පිටුවේ පාලර්මේන්තු මහලේකම්තුමිය සඳහන් කරනවා "මේ සම්මත පටිපාටියෙන් බැහැරව මේ සිදුවුණත්, මේ සිදුවීම මේ දක්වා මාධ්‍ය විසින් වාතර්ා කර නොමැති බවද නිරීක්ෂණය කරමි" කියලා. ඔන්න දැන් ඒකත් හරි, අද මාධ්‍යවලට පුළුවන් ඒකත් වාතර්ා කරලා ඒ අඩුපාඩුවත් සම්පූර්ණ කරන්න.

අටවන චෝදනාව: කථානායකවරයාගේ නැති මාධ්‍ය අංශයකට NC 49 23 අංකය දරන වෑන් රථය පාලර්මේන්තුවේ වාහන ඇණියෙන් වෙන් කර ගැනීම. කථානායකවරයාට මාධ්‍ය අංශය කියලා වෙනම අංශයක් නෑ, පාලර්මේන්තුවේ සන්නිවේදන දෙපාතර්මේන්තුවේ සේවය ලබාගත යුතුයි. නැති මාධ්‍ය අංශයකට තමයි පාලර්මේන්තුවේ වෑන් රථයක් කථානායකවරයා වෙන් කරගෙන තිබෙන්නේ. වෙනම මාධ්‍ය අංශ තියෙන්නේ ජනපතිට සහ අගමැතිට පමණයි.

නවවන චෝදනාව: අර නැති මාධ්‍ය අංශයට කියලා කැමරා දෙකක් (ඡායාරූප ගන්න කැමරාවයි, වීඩියෝ කරන කැමරාවයි) අරගෙන, වෘත්තීය ඡායාරූප ශිල්පීන් වෙනුවට කළමනාකාර සහකාරවරුන් ලවා ඒ කැමරා භාවිතා කරන්න කටයුතු කරලා තියෙනවා. පාලර්මේන්තු කාය ර් මණ්ඩල ප්‍රධානී චමින්ද කුලරත්න මහත්තයාගේ වැඩ තහනමට ලක් කළාට පස්සේ මේ නැති මාධ්‍ය අංශයට වෑන් රථයක් සහ කැමරා දෙකක් ලබා ගත්තාය කියලා අල්ලස් කොමිසමට පැමිණිලි කළා. මේ පැමිණිල්ල කළාට පස්සේ ඉහමොළ රත් වෙච්ච කථානායකතුමා, අනේ ඇමති මණ්ඩල පත්‍රිකාවක් දාලා මගේ මාධ්‍ය අංශය විධිමත් කරලා දෙන්න කියලා අගමැතිතුමියගෙන් ඉල්ලීමක් කළා. අගමැතිතුමිය බෑ කිව්වා, සියලුම ලිපි ලේඛන මා සතුයි. ඊළඟට මුදල් අමාත්‍යාංශයේ කළමනාකාර සේවා දෙපාතර්මේන්තුවෙන් ඉල්ලනවා අනේ මේක විධිමත් කරලා දෙන්න කියලා, ඒ අයත් බෑ කියනවා. ජනාධිපතිතුමාට ලියනවා අනේ මේක විධිමත් කරලා දෙන්න කියලා. මොකක් ද මෙතුමා මේ කියන්නේ. මට මේ තනියෙන් පරිප්පුව කන්න බෑ, කන පරිප්පුව බෙදාගෙන කමුයි කියලා. අගමැතිතුමියත් බෑ කිව්වා, මුදල් අමාත්‍යාංශයත් බෑ කිව්වා, ඔන්න ජනාධිපති ලේකම්තුමාත් බෑ කියලා ලියුමක් එවනවා. ඒ නිසා මේ පරිප්පුව නම් කථානායකතුමාට තනියෙන් කන්නට සිද්ධ වෙනවාමයි.

දසවන චෝදනාව: ඇමති තනතුරට හෝ කතානාය ධූරයට එක් ඉන්ධන දීමනාවක් සහ දිස්ත්‍රිකය අනුව මන්ත්‍රී තනතුරට තවත් ඉන්ධන දීමනාවක් ලැබෙනවා. ඇමති මණ්ඩලය තීරණයක් ගෙන ප්‍රසිද්ධ කලා අපි ඇමති ඉන්ධන දීමනාව විතරයි ගන්නේ කියලා. නමුත් කථානායකතුමා කථානායක ඉන්ධන දීමනාව සහ පොළොන්නරුවේ මන්ත්‍රී කෙනෙකු ලෙස ලැබෙන ඉන්ධන දීමනාව යන දෙකම ලබා ගනිමින් ඉහත ප්‍රකාශයට අනුව වංචනිකව කටයුතු කර තිබීම.

කථානායකවරයාගේ දූෂණ පිළිබඳව වරින් වර විවිධ අය, පාලර්මේන්තුවේ කායර් මණ්ඩල ප්‍රධානියාද ඇතුළුව විවිධ අය පැමිණිලි අල්ලස් කොමිසමට ඉදිරිපත් කළත්, ඒ අයට මේ සාක්ෂි ඉදිරිපත් කරන්න බැරි වුණා. අල්ලස් කොමිසමටත් මේ දවස වෙනකන්ම සාක්ෂි හොයාගන්න බැරි වුණා. ඔන්න දැන් කථානායකතුමාට පින්සිද්ධ වෙන්න එතුමා හදපු වාතර්ාවෙන්ම එතුමාට එරෙහිව තියෙන චෝදනා දහයක සාක්ෂි අප සතුව තිබෙනවා.

දැන් ඉතින් අල්ලස් කොමිසමට ඉතුරු වෙලා තියෙන්නේ මේ තොරතුරු ටික පදනම් කරගෙන කථානායකතුමාව අත්අඩංගුවට අරගෙන, පොදු දේපළ පනත යටතේ අධිකරණයට ඉදිරිපත් කරලා බන්ධනාගාරගත කරන එක විතරයි. මොකද ඇප ලැබෙන්නැති වරදක්නේ. ඒ නිසා අපි ඉදිරි සතියේදී මේ වාතර්ාව අල්ලස් කොමිසමට භාර දෙන්න කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා නුදුරු දිනක ලංකා ඉතිහාසයේ තනතුරේ සිටියදී අත්අඩංගුවට ගත් පළවෙනි කථානායකවරයා ලෙස ජගත් වික්‍රමරත්න මහතා ඉතිහාසයට එකතු වෙනවා, ඔබේ මාධ්‍යයෙන් ඔබට වාතර්ා කරන්න පුළුවන්.

ජනපතිගේ ජනප්‍රියතාවය 75% නම් වහාම මැතිවරණ පවත්වමු

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තමන් පැවැත්වූ ජනමත විමසුමක් ප්‍රසිද්ධ කරමින්, ජනාධිපතිතුමාගේ ජනප්‍රියතාවය 75% ඉක්මවා ඉහළ ගොස් ඇති බව ප්‍රකාශ කළා. මේක කළේ අප්‍රේල් මාසේ පළවෙනිදා නම්, මෝඩයන්ගේ දිනයට කරපු විහිළුවක් කියලා අපට නොසලකා හරින්න තිබුණා. නමුත් මේක කළේ ජූලි මාසේ නිසා අපට එහෙම හිතන්න බැහැ. මේ වාතර්ාව පිළිබඳව අපි නොසලකා හිටියොත්, මේ ටොම්පවයෝ 2029 දී ජනාධිපතිතුමාගේ ජනප්‍රියතාවය 175% දක්වා ඉහළ ගොස් තිබෙනවා කියලත් වාතර්ා කරන්න ඉඩ තිබෙනවා.

සමස්ත ජාතියම සම්බන්ධ වුණු ජනමත විමසුම් තුනක් වසරක් ඇතුළත පැවැත්වුණා.

2024 සැප්තැම්බර් මාසයේ පැවති ජනාධිපතිවරණයේදී මාලිමාවට (අනුර ජනාධිපතිතුමාට) ලැබුණේ 42%ක ඡන්ද ප්‍රතිශතයක්.

ඊට මාස දෙකකට පස්සේ, 2024 නොවැම්බර් මාසයේ පැවති පාලර්මේන්තු මැතිවරණයේදී මාලිමාවට 62%ක් ලැබුණා.

ඒ තමයි ආණ්ඩුවේ ජනප්‍රියතාවය උච්චස්ථානයේ තිබුණු කාලය.

දැන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කියනවා, ඒ ප්‍රතිශතය 75.5%ක් දක්වා වධර්නය වෙලා කියලා.

ඒ කියන්නේ පාලර්මේන්තු මැතිවරණ කාලයේ තිබුණු ජනප්‍රියතාවයටත් වඩා 12%කින් වැඩි වෙලා.

හැබැයි, පාලර්මේන්තු මැතිවරණයේදී 62%ක් ලබාගත් මාලිමාව, ඊට මාස හයකට පස්සේ (2025 මැයි මාසයේදී) පැවති පළාත් පාලන (පුංචි ඡන්දයේදී) ලබාගත්තේ 43%ක් පමණයි. මාස හයක් ඇතුළත ආණ්ඩුවේ ජනප්‍රියතාවය බරපතළ ලෙස කඩා වැටීමකට ලක්වුණා.

දැන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කියනවා  පාලර්මේන්තු මැතිවරණ කාලයේ තිබුණු ආණ්ඩුවේ ජනප්‍රියත්වයටත් වඩා දැන් ආණ්ඩුවේ ජනප්‍රියතාවය ඉහල ගිහින් කියලා.

පුංචි ඡන්දය සහ මේ සමීක්ෂණය අතරතුර කාලයේදී, හිඟන්නෝ විදිහට රඟපාමින් ජනතාව රවටපු මැති ඇමතිවරුන්ගේ සැබෑ තත්ත්වය හෙළිදරව් වුණා.

ගල් අඟුරු වංචාව හෙළිදරව් වුණා.

භාණ්ඩාගාරයේ ඩොලර් ලක්ෂ 25ක් අතුරුදහන් වුණා.

තැපැල් දෙපාතර්මේන්තුවේ ඩොලර් ලක්ෂ 7ක් අතුරුදහන් වුණා.

ගොවියාට සහතික මිලක් වී වලට ලබාගන්න බැරුව ගොවියව අතරමං කළා.

කැකුළු හාල් හිඟය, පොල් හිඟය, ලූණු හිඟය, බෙහෙත් හිඟය සහ පොහොර හිඟය වැනි සෑම ආකාරයකම භාණ්ඩ හිඟයන්ට ජනතාවට මුහුණ පාන්න සිද්ධ වුණා.

එවැනි පසුබිමක, 43% තිබුණු ජනප්‍රියතාවය 75% දක්වා ඉහළ නගින්න කිසිම විදිහක් නැහැ කියන එක සාමාන්‍ය සිහිබුද්ධිය තියෙන ඕනෑම කෙනෙකුට තේරෙනවා.

මේ සමීක්ෂණයේ පරස්පර කතා ගොඩක් තිබෙනවා.

වාතර්ාවට අනුව, ජනතාවගෙන් 82%ක් කියනවා තමන්ගේ ආථරීක මට්ටම එක්කෝ එකතැන පල්වෙනවා, නැත්නම් තිබුණටත් වඩා නරක අතට හැරිලා තියෙනවා කියලා.

එහෙම වාතාවරණයක් යටතේ ජනාධිපතිතුමාට කැමති පිරිස 75%ක් වෙන්නේ කොහොමද?

වාතර්ාවේ 18%ක් කියනවා තමන්ගේ ආථරීක මට්ටම පසුගිය වසරට වඩා හොඳ අතට හැරිලා කියලා.

අන්න ඒ 18%, අපි ජනාධිපතිතුමාට කැමතියි කියනවා නම්, ඒක තේරුම් ගන්න පුළුවන් කාරණයක්.

විශේෂයෙන්ම, ජනතාවගෙන් 44%ක්ම කියනවා ආණ්ඩුව විසින් ජීවන වියදම කළමනාකරණය කිරීම පිළිබඳව අතෘප්තිමත් කියලා. ඒ එම ජනතාව ජනාධිපතිතුමාට කැමති කියලා තීරණය කළා කියන එක අපි විශ්වාස කරන්නේ කොහොමද?

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කරලා තියෙන සමීක්ෂණයේ බරපතළ අඩුපාඩු ගණනාවක් තියෙනවා.

මිලියන 22ක ජනගහනයක මතය දැනගන්න, මේ අය නියැදිය විදිහට භාවිතා කරලා තියෙන්නේ පුද්ගලයන් 1,240ක් පමණයි.

නියැදිය කුඩා වෙන්න කුඩා වෙන්න, මහජන මතය විකෘති වීමේ අවදානමක් තියෙනවා කියන එක සංඛ්‍යා ලේඛන විද්‍යාවේ උගන්වන වැදගත් මූලධමර්යක්.

ඒ වගේම, මේ සමීක්ෂණයට අනුග්‍රහය දැක්වූයේ කවුදැයි වාතර්ාවේ සඳහන් වෙන්නේ නැහැ.

මෙවැනි සමීක්ෂණයක් කරන්න සල්ලි වියදම් කළ කෙනා දැනගත්තම, සමීක්ෂණයේ යටි අරමුණු තිබුණාද නැද්ද යන්න හොයා බලන්න තිබුණා.

මේ නියැදිය නියෝජිතත්ව නියැදියක් (Representative sample) නෙවෙයි. ඒ කියන්නේ රටේ ජනගහනයේ ලක්ෂණ මේ නියැදිය තුළ ප්‍රතිනිමර්ාණය වෙලා නැහැ.

උදාහරණයක් ලෙස, ලංකාවේ බෞද්ධයන් 70%ක් ඉන්නවා. නියෝජිතත්ව නියැදියක් නම් අර 1,240න් 868ක් බෞද්ධ වෙන්න ඕනේ. නමුත් මේ අය කරලා තියෙන්නේ අහඹු ලෙස 1,240ක් සමීක්ෂණයට ගන්නවා. ඒ අය අතර බෞද්ධයන් ඉන්නේ 100යි නම්, ඒක අර 868ක් හිටියා විදිහට බර තැබීමකින් වැඩි කරනවා.එහෙම බර තැබීමක් කරද්දී, ඒ බර තැබීම කෙතරම් යථාථර්වාදීද කියලා දැනගන්න ජාතිය, ආගම, වයස, ස්ත්‍රී පුරුෂ භාවය, අධ්‍යාපන මට්ටම වැනි නියැදියේ ලක්ෂණ වාතර්ාවේ හෙළිදරව් කළ යුතු වුවත්, එවැනි හෙළිදරව් කිරීමක් වාතර්ාවේ නැහැ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කියන්නේ විදේශීය ආධාර ලබමින්, බලය බෙදීම වෙනුවෙන් දශක ගණනාවක් පුරාවට දැඩි ලෙස පෙනී සිටින රාජ්‍ය නොවන සංවිධානයක් (NGO). මට හිතෙන විදිහට නම් මේ අය ආණ්ඩුව පළාත් සභා මැතිවරණය පවත්වන්න පැකිලෙමින් ඉන්න නිසා, "නැහැ නැහැ, ඕගොල්ලෝ මාර ජනප්‍රියයි, බය නැතුව පළාත් සභා මැතිවරණය තියන්න" කියලා ආණ්ඩුව ගොනාට ඇන්දීමට දක්වපු උත්සාහයක් විදිහටයි මේ සමීක්ෂණ වාතර්ාව අපි දකින්නේ.